*සැ. යු.*- (i) 2018.03.16 දින පළ වූ අංක 2,063 දරන *ගැසට් පත්‍රයේ* IV (අ) කොටස පළ නොවීය.

(ii) මෙවර පළවන *ගැසට් පත්‍රයේ* VI කොටසේ 2018 වර්ෂය සඳහා බදුල්ල දිස්ත්‍රික්කයට අයත් අධිකරණ කලාපවල ජූරි සභිකයින්ගේ නාමාවලියක් සිංහල භාෂාවෙන් පළ වේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,064 - 2018 මාර්තු මස 23 වැනි සිකුරාදා - 2018.03.23**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | — |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | 504 |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |

*සැ. යු.* - (i) ශ්‍රී ලංකා තේ මණ්ඩල (සංශෝධන) පනත් කෙටුම්පත 2018 මාර්තු මස 09 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

(ii) ජාතික ආරක්ෂක අරමුදල් (සංශෝධන) පනත් කෙටුම්පත 2018 මාර්තු මස 09 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

**වැදගත් නිවේදනයයි**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2018 අප්‍රේල් මස 12 වැනි දින පළ කරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2018 මාර්තු මස 29 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.)*

2018 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

503 - B 81266 — 5,403 (2018/03)
F 1 -

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

## බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ සමුපකාර සංවර්ධන නිලධාරි III ශ්‍රේණියේ තනතුරු සඳහා බඳවා ගැනීමේ විවෘත තරග විභාගය -2018

බස්නාහිර පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කළමනාකරණ සහකාර (තාක්ෂණික) සේවා ගණයේ සමුපකාර සංවර්ධන නිලධාරි තනතුරට බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ 7 වගන්තිය අනුව සමුපකාර සංවර්ධන නිලධාරි III ශ්‍රේණියේ තනතුරු සඳහා සුදුස්සන් තෝරා ගැනීමේ විවෘත තරග විභාගයක්, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පවත්වනු ලබන අතර මෙම නිවේදනයේ දක්වා ඇති පරිදි අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති අපේක්ෂකයින්ගෙන් අයදුම්පත් මෙයින් කැඳවනු ලැබේ.

02. *පුරප්පාඩු සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මකවන දිනය :*

දැනට බඳවා ගැනීමට අනුමැතිය ලැබී ඇති පුරප්පාඩු 45ක් සඳහා සුදුස්සන් තෝරා ගැනීමට මෙම විභාගය පවත්වනු ලබයි. දැනට පවත්නා පුරප්පාඩුවලට හෝ මතුවට ඇතිවන පුරප්පාඩු සඳහා බඳවා ගන්නා සංඛ්‍යාව පිළිබඳ අවසන් තීරණය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතු වේ.පත් කරනු ලබන සංඛ්‍යාව හා පත්වීම ක්‍රියාත්මකවන දිනය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබේ.

03. *සේවා කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. ඔබට හිමි විශ්‍රාම වැටුප් ක්‍රමය පිළිබඳ රජය විසින් ඉදිරියේදී ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයට ඔබ යටත් විය යුතු වේ.

(ii) මෙම තනතුරට බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලබන අපේක්ෂකයින් පත් කරනු ලබන දින සිට තුන් අවුරුදු පරිවාස කාලයකට යටත්ව මෙම සේවයට පත් කරනු ඇත.

(iii) තනතුරට බඳවා ගැනීමෙන් පසු සමුපකාර සංවර්ධන නිලධාරීන් බඳවා ගැනීමේ හා උසස් කිරීමේ පරිපාටියේ දැක්වෙන ආකාරයට කාර්යක්ෂමතා කඩඉම් හා රාජ්‍ය භාෂා ප්‍රවීණතා විභාගවලින් සමත් විය යුතුය.

(iv) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයට හා බස්නාහිර පළාත් සභා රාජ්‍ය සේවයේ කාර්ය පරිපාටික රීති සංග්‍රහයට ද, බස්නාහිර පළාත් සභාවේ මූල්‍ය රීති සංග්‍රහයට ද, බස්නාහිර පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමා විසින් පනවනු ලබන රෙගුලාසිවලට නොහොත් නියෝගවලට ද, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කලින් කල පනවනු ලබන වෙනත් රෙගුලාසි නොහොත් නියෝගවලට ද, අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු නියෝග වලට ද අනුව කටයුතු කල යුතු ය.

04. *වැටුප් පරිමාණය :*

අංක 03/2016 හා 2016.02.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ උපලේඛන I ට අනුව, මෙම තනතුරට අදාළ මාසික වැටුප් පරිමාණය රු.31,040-10x445-11x660-10x730-10x750-57,550/-(MN 3-2016) වේ. නමුත් ඔබට වැටුප් ගෙවනු ලබන්නේ එම චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව එහි උපලේඛන II හි සඳහන් පරිදි වේ.

05. පහත සඳහන් පරිදි පොදු සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතු ය :

*(අ)* ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතු ය.

*(ආ)* බස්නාහිර පළාත තුළ ඕනෑම දිස්ත්‍රික්කයක සේවය කිරීමටත් තනතුරේ රාජකාරි ඉටුකිරීමටත් ප්‍රමාණවත් මනා ශාරීරික හා මානසික යෝග්‍යතාවයකින් යුක්ත විය යුතුය.

*(ඇ)* අයදුම්පත් භාර ගන්නා අවසාන දිනට පූර්වාසන්නයෙන් අවම වශයෙන් වසර 03ක වත් බස්නාහිර පළාතේ ස්ථිර පදිංචිකරුවකු විය යුතුය.

*(ඈ)* වයස් සීමාව වයස අවු. 18 ට නොඅඩු හා අවු. 30ට නොවැඩි විය යුතු ය. (දැනට රාජ්‍ය/පළාත් රාජ්‍ය සේවයේ යෙදී සිටී නම් උපරිම වයස් සීමාව බල නොපැවැත් වේ.)

*(ඉ)* මෙම තනතුරට බඳවා ගැනීම සඳහා අවශ්‍ය මෙම නිවේදනයේ සඳහන් සියලුම සුදුසුකම් 2018.04.20 වැනි දිනට සෑම ආකාරයකින් ම සම්පූර්ණ කර තිබිය යුතු අතර යහපත් චරිතයකින් යුක්ත විය යුතුය.

06. පහත සඳහන් පරිදි අධ්‍යාපන සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය :

(i) සිංහල/දෙමළ/ඉංග්‍රීසි භාෂාව, ගණිතය සහ තවත් විෂයයන් දෙකකට සම්මාන සාමාර්ථයන් සහිතව එකවර විෂයයන් හයකින් (06) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය සමත් වී තිබීම.

*සහ*

(ii) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගයේදී සියලුම විෂයයන් එකවර (සාමාන්‍ය පොදු පරීක්ෂණය හැර) සමත් වී තිබීම. (පැරණි විෂය නිර්දේශය යටතේ එකවර විෂයන් 03 ක් සමත් වීම ප්‍රමාණවත් වේ.)

07. පහත සඳහන් පරිදි වෘත්තීය සුදුසුකම් සම්පූර්ණ කර තිබිය යුතුය :

(i) ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ උසස් ගණකාධිකරණය පිළිබඳ වසර 01 ක ඩිප්ලෝමාව සමත්ව තිබීම ;

*හෝ*

(ii) ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ උසස් විගණනය පිළිබඳ වසර 01 ක ඩිප්ලෝමාව සමත්ව තිබීම ;

*හෝ*

(iii) ජාතික සමුපකාර සංවර්ධන ආයතනයේ උසස් කළමනාකරණය පිළිබඳ වසර 01 ක ඩිප්ලෝමාව සමත්ව තිබීම ;

*හෝ*

(iv) ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ (AAT) අවසාන අදියර සමත් වී තිබීම ;

*හෝ*

(v) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමත විශ්වවිද්‍යාලයකින් වසර 01 ක ගණකාධිකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සමත් වී තිබීම ;

*හෝ*

(vi) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමත විශ්වවිද්‍යාලයකින් වසර 01 ක කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් සමත් වී තිබීම ;

*හෝ*

(vii) ජාතික උසස් තාක්ෂණ ආයතනයේ ගණකාධිකරණය පිළිබඳ වසර 04 ක උසස් ඩිප්ලෝමාව සමත් වී තිබීම ;

*හෝ*

(viii) ජාතික උසස් තාක්ෂණ ආයතනයේ ව්‍යාපාර පරිපාලනය පිළිබඳ වසර 03 ක උසස් ඩිප්ලෝමාව සමත් වී තිබීම ;

*හෝ*

(ix) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමත විශ්වවිද්‍යාලයකින් කළමනාකරණය පිළිබඳ උපාධියක් ලබා තිබීම;

*හෝ*

(x) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමත විශ්වවිද්‍යාලයකින් ගණකාධිකරණය පිළිබඳ උපාධියක් ලබා තිබීම;

*හෝ*

(xi) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ අනුමත විශ්වවිද්‍යාලයකින් වාණිජවේදී උපාධියක් ලබා තිබීම.

08. *විභාගය පිළිබඳ විස්තර :*

බඳවා ගැනීමේ විවෘත තරග විභාගය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ.මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත්වෙන අතර ඉල්ලුම් කරන මාධ්‍ය පසුව වෙනස් කිරීමට ඉඩ දෙනු නොලැබේ. මෙම විභාගය තරග විභාගයක් බැවින්, පත්වීම ලැබීමට සුදුසුකම් ලැබීම සඳහා එක් එක් විෂයය සදහා වෙන්කර ඇති ලකුණුවලින් යටත් පිරිසෙයින් සියයට හතලිහක් (40%) බැගින්වත් අපේක්ෂකයන් විසින් ලබාගත යුතුය. තරග විභාගයේ ප්‍රථිඵල මත ලකුණුවල කුසලතා අනුපිළිවෙල අනුව බඳවා ගනු ලැබේ.

| *ප්‍රශ්න පත්‍රය* | *මුළු ලකුණු* | *කාලය* | *සමත් ලකුණු* |
|---|---|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | 100 | පැය 01 යි | 40% |
| 2. සාමාන්‍යය දැනීම හා විෂයානුබද්ධ දැනීම | 100 | පැය 01 යි | 40% |

09. *විභාගය සඳහා වන විෂය නිර්දේශය :*

| *ප්‍රශ්න පත්‍රයේ නම* | *විෂය නිර්දේශය* |
|---|---|
| 1. බුද්ධි පරීක්ෂණය | මෙම ප්‍රශ්න පත්‍රය අපේක්ෂකයන්ගේ සිතීමේ තර්කානුකූලභාවයෙන්ද, විශ්ලේෂණ හැකියාවන් ද, තීරණ ගැනීමේ ශක්තීන්ද විනිශ්චය කිරීම සඳහා බහුවරණ හා කෙටි පිළිතුරු අපේක්ෂිත ප්‍රශ්න 50 කින් සමන්විත වූ ප්‍රශ්න පත්‍රයකි. |
| 2. සාමාන්‍ය දැනීම හා විෂයානුබද්ධ දැනීම | *(අ)* ජාතික හා ජාත්‍යන්තර සමාජ ආර්ථික හා දේශපාලන දැනුම<br>*(ආ)* සමුපකාර දර්ශනය හා ව්‍යාපාර පිළිබඳ දැනුම<br><br>බහුවරණ හා කෙටි පිළිතුරු අපේක්ෂිත ප්‍රශ්න 50 කින් සමන්විත වූ ප්‍රශ්න පත්‍රයකි. |

09.1 විභාගය පැවැත්වීමට යෝජිත නගර හා නගර අංක ;

| *නගරය* | *නගර අංකය* |
|---|---|
| කොළඹ | 1 |
| ගම්පහ | 2 |
| කළුතර | 3 |

*සැ.යු.*- විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කළ නගර පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ. යම් නගරයකට ඉල්ලුම් කල අපේක්ෂකයන් ගණන ප්‍රමාණවත් නොවේ නම්, දෙවන කැමැත්ත ලෙස සඳහන් කළ නගර වෙත යොමු කෙරෙන අතර, එම දෙවන නගරය සඳහා ද ප්‍රමාණවත් අපේක්ෂකයින් ගණනක් නොසිටියහොත් යාබද නගරයක් වෙත යොමු කරනු ලැබේ.

10. *විභාග ගාස්තු :*

සෑම අපේක්ෂකයෙකු ම විභාග ගාස්තුවක් බස්නාහිර පළාත් සභාවට ගෙවිය යුතුවේ. මෙම විභාගය සඳහා විභාග ගාස්තුව රු. 600/- කි. එම විභාග ගාස්තුව, බස්නාහිර පළාත් සභා ආදායම් ශීර්ෂ 20-03-02-99 ට බැර වන ලෙස අයදුම්පත්‍ර භාරගනු ලබන අවසාන දිනට හෝ ඊට ප්‍රථම, බස්නාහිර පළාත තුළ පිහිටා ඇති ඕනෑම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයකට මුදලින් ගෙවා ඔබගේ නමින්

ලබා ගන්නා ලදුපත අයදුම් පත්‍රයේ නියමිත ස්ථානයේ නොගැලවෙන සේ අලවා තිබිය යුතුය. එහි ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. මෙම විභාගය සඳහා ගෙවන ලද ගාස්තුව කුමන කරුණක් නිසාවත් සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන් හෝ ආපසු ගෙවනු නොලැබේ. තව ද විභාග ගාස්තුව සඳහා මුද්දර හෝ මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.

11. අයදුම්කිරීමේ ක්‍රමය :

(අ) අයදුම්පත්‍රය මෙම නිවේදනයට යා කොට ඇති ආදර්ශ ආකෘතියට අනුකූලව කඩදාසියේ දෙපසම භාවිතා කරමින් ඒ 4 ප්‍රමාණයේ කඩදාසිවල පිළියෙළ කර අපේක්ෂකයා තම අත් අකුරින්ම පැහැදිලිව පිරවිය යුතුය. අංක 01 සිට 04 තෙක් ඡේදයන් පළමු පිටුවට ද, අංක 05 සිට ඉදිරියට වන ඡේදයන් අනෙක් පිටුවලට ද, ඇතුළත් වන සේ අයදුම්පත්‍ර පිළියෙල කර ගත යුතුය. නියමිත ආදර්ශ ආකෘතියට අනුකූල නොවන, නියමිත දිනට පෙර විභාග ගාස්තු ගෙවා නොමැති හා නිවැරදිව සම්පූර්ණ කර නොමැති, අසම්පූර්ණ තත්ත්වයේ පවතින අයදුම්පත්‍ර කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. නිසි පරිදි අයදුම්පත්‍ර සම්පූර්ණ නොකිරීමෙන් සිදුවන පාඩුව අයදුම්කරුවන් විසින් දරාගත යුතුය. අයදුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබා ගැනීම ප්‍රයෝජනවත් වනු ඇත.

(ආ) අයදුම්පත පිළියෙල කර ගන්නා විට එහි ශීර්ෂයේ සඳහන් විභාගයේ නම සිංහල අයදුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද, සඳහන් කළ යුතුය.

(ඇ) සම්පූර්ණ කරන ලද අයදුම්පත්‍රය 2018.04.20 වැනි දින හෝ ඊට පෙර ලැබෙන සේ "ලේකම්, බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව, අංක 109, මහවීදිය, බත්තරමුල්ල" වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත්‍රය බහා එවන කවරයේ වම් පස ඉහළ කෙළවරේ **"බ.ප සමුපකාර සංවර්ධන නිලධාරී 111 ශ්‍රේණියට බඳවා ගැනීමේ තරග විභාගය-2018"** යන්න පැහැදිලි ලෙස සඳහන් කළ යුතුය. මෙදිනට පසුව ලැබෙන කිසිම අයදුම්පත්‍රයක් භාරගනු නොලැබේ.

(ඈ) නිවේදනයේ සඳහන් සුදුසුකම් සහිත බව දක්වමින්, මෙම නිවේදනයට අනුකූලව සකසා ඇති හා නියමිත විභාග ගාස්තු ගෙවා නියමිත දිනට හෝ එදිනට පෙර හෝ අයදුම්පත් ඉදිරිපත් කර ඇති සියලුම අයදුම්කරුවන්ට නියමිත සුදුසුකම් සපුරා ඇතැයි යන පූර්ව නිගමනය මත තරග විභාගයට පෙනී සිටීමට බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ඉඩදෙනු ලැබේ. සෑම ආකාරයකින්ම සම්පූර්ණ වී නැති අයදුම්පත්‍රය කිසිදු දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ඇත. තැපැල් කිරීමේ දී අයදුම්පතක් නැතිවීම හෝ ප්‍රමාද වීම ගැන කෙරෙන කිසිම පැමිණිල්ලක් සලකා බලනු නොලැබේ. අපේක්ෂකයෙකුට විභාග ප්‍රවේශපත්‍රයක් නිකුත් කිරීම ඔහු හෝ ඇය මෙම තනතුර සඳහා සුදුසුකම් සපුරා ඇති බවට පිළිගැනීමක් ලෙස සලකනු නොලැබේ. අයදුම්කරුවන් සම්මුඛ පරීක්ෂණයට කැඳවා නිවේදනයට අනුව අදාළ සුදුසුකම් තිබේදැයි පරීක්ෂා කරන අවස්ථාවේදී අවශ්‍ය සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් ඔහුගේ /ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කෙරෙනු ඇත.

(ඉ) අයදුම්පත්‍ර ලැබුණු බව දන්වනු නොලැබේ. අයදුම්කරුවන් වෙත ප්‍රවේශපත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් නිවේදනයක් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිල වෙබ් අඩවිය www.psc.wp.gov.lk මගින් පළ කරනු ඇත. නිවේදනය පළවී දින 02 ක් හෝ ගත වූ පසුවත් ප්‍රවේශපත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය වෙත දන්වා සිටිය යුතුය. ඔබ වෙත තබා ගත් අයදුම්පත්‍රයේ සහ මුදල් ගෙවූ කුවිතාන්සියේ ඡායා පිටපතක් ද, අයදුම්පත්‍රය ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, අතැතිව ඔබගේ සම්පූර්ණ නම, ලිපිනය, ජාතික හැඳුනුම්පත් අංකය හා විභාගයේ නම නිවැරදිව සඳහන් කරමින් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලයෙන් විමසිය යුතුය.

(ඊ) අයදුම්පත්‍රයේ හා විභාග ප්‍රවේශ පත්‍රයේ අත්සන් සහතික කිරීමට බලයලත් අයෙකු විසින්, අයදුම්කරුගේ අත්සන සහතික කළ යුතු ය. දැනටමත් රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ නියුතු නිලධාරීන් අත්සන අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානියා හෝ ඔහු වෙනුවෙන් එසේ කිරීමට බලයලත් නිලධාරියෙකු ලවා ද, අනෙකුත් අයදුම්කරුවන් අත්සන සාමදාන විනිශ්චයකාරවරයෙකු, දිවුරුම් කොමසාරිස්වරයෙකු, නීතිඥවරයෙකු, ප්‍රසිද්ධ නොතාරිස්වරයෙකු, රජයේ විද්‍යාලයක විදුහල්පතිවරයෙකු, (රු.240,360/-ක් හෝ ඊට වැඩි වාර්ෂික වැටුපක් ලබන රාජ්‍ය හෝ පළාත් රාජ්‍ය හෝ ස්ථිර මාණ්ඩලික ශ්‍රේණියේ නිලධාරියෙකු) බෞද්ධ විහාරයක විහාරාධිපති හෝ නායක ස්වාමීන් වහන්සේ කෙනෙකු, අන්‍ය ආගමික පූජ්‍ය ස්ථානයක් භාර හෝ පූජ්‍ය පක්ෂයේ සැලකිය යුතු තත්ත්වයක් දරන පූජක කෙනෙකු, ත්‍රිවිධ හමුදාවේ අධිකාරි බලයලත් නිලධාරිවරයෙකු, පොලිස් සේවයේ *ගැසට්* කළ තනතුරක් දරන නිලධාරියෙකු, හෝ යන මොවුන්ගෙන් කවරෙකු හෝ ලවා සහතික කරවා ගත යුතු ය.

12. *විභාගයට ඇතුල්වීම* :

(අ) නිවැරදිව අයදුම්පත් යොමු කර ඇති සියලුම අයදුම්කරුවන් වෙත බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් ප්‍රවේශපත්‍ර නිකුත් කරනු ඇත. විභාගයට පෙනී සිටින අපේක්ෂකයෙකු තමාට නියමිත විභාග මධ්‍යස්ථානයේ දී විභාගයට පෙනී සිටිය යුතු අතර, එසේ පෙනී සිටින පළමු දිනයේ දී ම තම අත්සන සහතික කරවා ගත් ප්‍රවේශ පත්‍රය ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය. තම ප්‍රවේශ පත්‍රය ඉදිරිපත් නොකරන අපේක්ෂකයෙකුට විභාගයට පෙනී සිටීමට අවසර දෙනු නොලැබේ.

(ආ) විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් නියම කරන ලද නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ.එම නීති රීති උල්ලංඝනය කළහොත් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන දඬුවමකට යටත්වීමට ඔවුනට සිදුවනු ඇත.

13. අපේක්ෂකයාගේ අනන්‍යතාවය.- තමා පෙනී සිටින සෑම විෂයයක් සම්බන්ධයෙන්ම විභාග ශාලාධිපති සෑහීමකට පත්වන අයුරින් අපේක්ෂකයන් විභාග ශාලාවේ දී තම අනන්‍යතාව ඔප්පු කර සිටිය යුතුය. අපේක්ෂකයන්ගේ අනන්‍යතාව සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියවිලිවලින් එකක් විභාග ශාලාධිපති වෙත ඉදිරිපත් කළ යුතුය.

(i) පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව මඟින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත,
(ii) ආගමන විගමන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද වලංගු විදේශ ගමන් බලපත්‍රයක්

14. *සාවද්‍ය තොරතුරු ඉදිරිපත් කිරීම* :

අපේක්ෂකයෙකුට සුදුසුකම් නොමැති බව අනාවරණය වුවහොත් විභාගයට පෙර හෝ විභාගය පැවැත්වෙද්දී හෝ විභාග යෙන් පසුව හෝ ඕනෑම අවස්ථාවක දී, ඔහුගේ/ඇයගේ අපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ ඇත. අයදුම්කරු විසින් ඉදිරිපත් කරන ලද තොරතුරක් ඔහු/ඇය එය සාවද්‍ය බව දැන දැනම ඉදිරිපත් කර ඇති බව හෙළිවුවහොත්, එසේ නැතිනම් යම් වැදගත් කරුණක් ඔහු/ඇය විසින් උවමනාවෙන්ම යටපත් කර ඇති නම්, ඔහු/ඇය රජයේ සේවයෙන් පහ කිරීමට ඉඩ ඇත.

15. *විභාග ක්‍රමය* :

(i) මෙම විභාගය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි මාධ්‍යවලින් පැවැත්වේ.
(ii) අපේක්ෂකයෙකු විභාගයේ දී පෙනී සිටින සියලුම ප්‍රශ්න පත්‍රවලට එකම භාෂාවකින් පිළිතුරු ලිවිය යුතු ය.

16. මෙම විභාගයෙන් සුදුසුකම්ලත් අපේක්ෂකයින්ගේ නම් ඇතුළත් ප්‍රතිඵල ලේඛනය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් අයදුම්කරුවන් වෙත පෞද්ගලිකව ප්‍රතිඵල දන්වා යැවීම, තැපැල මගින් හෝ බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ www.psc.wp.gov.lk නිල වෙබ් අඩවිය ඔස්සේ සිදු කරනු ඇත.

17. මෙම අයදුම්පත් කැඳවීමේ නිවේදනයෙන් අනාවරණය වන / නොවන අදාළ කරුණු පිළිබඳව අවසන් තීරණය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව සතුවේ.

18. මෙම *ගැසට්* නිවේදනය සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි අනුවාද අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත් එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතුය.

19. මෙම දැන්වීම හා ආදර්ශ අයදුම් පත්‍රය බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ www.psc.wp.gov.lk නිල වෙබ් අඩවියේද පළ කර ඇත.

එම්. ජී. ඒ. තිලකරත්න,
ලේකම්,
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව,
බස්නාහිර පළාත.

2018 මාර්තු මස 19 වැනි දින,
බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභා කාර්යාලය,
අංක 109,
මහවීදිය, බත්තරමුල්ල.

ආදර්ශ අයදුම්පත්‍රය

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ සමුපකාර සංවර්ධන නිලධාරි III වැනි ශ්‍රේණියට බඳවා ගැනීම සඳහා වන විවෘත තරග විභාගය - 2018

OPEN COMPETITIVE EXAMINATION FOR RECRUITMENT TO GRADE 111 OF WESTERN PROVINCIAL CO-OPERATIVE DEVELOPMENT OFFICER - 2018

(කාර්යාලයීය ප්‍රයෝජනය සඳහා)

* විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය :
සිංහල - 2
දෙමළ - 3
ඉංග්‍රීසි - 4
(අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

- විභාගයට පෙනී සිටීමට ඉල්ලුම් කරන නගරය හා නගර අංකය :

කොළඹ - 1
ගම්පහ - 2
කළුතර - 3

| | නගරය | නගර අංකය |
|---|---|---|
| 1. | | |
| 2. | | |

1.0 1.1 සම්පූර්ණ නම (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :........................................
උදා : (HERATH MUDIYANSELAGE SAMAN KUMARA GUNAWARDHANA)

1.2 (අගට යෙදෙන නම මුලින් ද අනෙකුත් නම්වල මුලකුරු පසුව ද යොදා නම (ඉංග්‍රීසි කැපිටල් අකුරින්)

........................................

(උදා. : GUNAWARDHANA, H. M. S.K.)

1.3 සම්පූර්ණ නම (සිංහලෙන්/දෙමළෙන්) :........................................

........................................

1.4 ජාතික හැඳුනුම්පත් අංකය : | | | | | | | | | | | | |

2.0 2.1 ස්ථිර ලිපිනය (ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්) :........................................

2.2 ස්ථිර ලිපිනය (සිංහලෙන්/දෙමළෙන්) :........................................

2.3 විභාග ප්‍රවේශ පත්‍රය එවිය යුතු ලිපිනය :........................................

(i) සිංහලෙන්/දෙමළෙන් :........................................

(ii) ඉංග්‍රීසි කැපිටල් අකුරෙන් :........................................

2.4 දුරකතන අංකය :........................................

3.0 3.1 ස්ත්‍රී/පුරුෂ භාවය : (අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

පුරුෂ - 0
ස්ත්‍රී - 1

3.2 අයදුම්කරුගේ ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය : කොළඹ - 1
ගම්පහ - 2
කළුතර - 3 (අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

3.3 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :...................................................................

3.4 බස්නාහිර පළාතේ ස්ථිරව පදිංචිව සිටින කාල සීමාව :........................................................

3.5 ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ උපතින් ද ? ලියාපදිංචියෙන් ද ? :.............................................

4.0 4.1 විවාහක/අවිවාහක බව : (විවාහක - 2, අවිවාහක -1)
(අදළ අංකය කොටුව තුළ ලියන්න.)

4.2 උපන් දිනය : වර්ෂය : මාසය : දිනය :

4.3 අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස : අවුරුදු : මාස : දින :

5.0 *අධ්‍යාපන සුදුසුකම් :*

5.1 අ.පො.ස. (සා.පෙළ) විභාගය පිළිබඳ විස්තරය :

(i) විභාගයේ වර්ෂය හා මාසය : වර්ෂය : මාසය :
(ii) විභාග අංකය :————.
(iii) ප්‍රතිඵල :————.

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| 1. | | 6. | |
| 2. | | 7. | |
| 3. | | 8. | |
| 4. | | 9. | |
| 5. | | 10. | |

5.2 අ.පො.ස. (උ.පෙළ) විභාගය පිළිබඳව විස්තරය :

(i) විභාගයේ වර්ෂය හා මාසය : වර්ෂය : මාසය
(ii) විභාග අංකය :————.
(iii) ප්‍රතිඵල :————.

| *විෂයය* | *සාමාර්ථය* |
|---|---|
| 1. | |
| 2. | |
| 3. | |
| 4. | |

6.0 අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ අංක 07 අනුව ලබා ඇති වෘත්තීය සුදුසුකම් ( නිවේදනයේ සඳහන් වෘත්තීය සුදුසුකම් වලට අදාල අනු අංකය ඉදිරියෙන් සටහන් කරන්න.)
(උදා :- ගණකාධිකරණ ශිල්පීය ආයතනයේ (AAT) අවසාන අදියර සමත් වී තිබීම IV )

(i) ..................................................................................... ☐

(ii) ..................................................................................... ☐

7.0 ඔබ කවරදාක හෝ කවර චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරු කරනු ලැබ තිබේ ද?

(අදාල කොටුවේ ✓ ලකුණ යොදන්න.) ඔව් ☐ නැත ☐

"ඔව්" නම් විස්තර සඳහන් කරන්න :.....................................................................................

8.0 විභාග ගාස්තු ගෙවූ ලදුපත පිළිබඳ විස්තර :

(i) විභාග ගාස්තු ගෙවූ ප්‍රාදේශීය ලේකම් කාර්යාලය :................................................
(ii) ලදුපත් අංකය හා දිනය :............................................................
(iii) ගෙවූ මුදල :........................................................................

| විභාග ගාස්තු ගෙවූ ලදුපත නොගැලවෙන සේ මෙහි අලවන්න. |
|---|

9.0 *අයදුම්කරුගේ සහතිකය :*

*(අ)* මෙම ඉල්ලුම්පත්‍රයේ මවිසින් සපයා ඇති තොරතුරු මා දන්නා තරමින් සත්‍ය හා නිවැරදි බව ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි. මෙහි යම් කොටස් සම්පූර්ණ නොකිරීමේ සහ /හෝ වැරදි ලෙස සම්පූර්ණ කිරීමෙන් සිදුවිය හැකි අලාභය විඳ දරා ගැනීමට එකඟ වෙමි. මෙහි සියළුම කොටස් නිවැරදිව සම්පූර්ණ කර ඇති බව ද ප්‍රකාශ කරමි.

*(ආ)* මවිසින් කරන ලද මෙම ප්‍රකාශය අසත්‍ය යැයි ඔප්පු වුවහොත්, අදාළ තනතුර සඳහා පත්කරනු ලැබීමට නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත්වන බවද මම දනිමි.

*(ඇ)* තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් පනවනු ලබන නීති රීතිවලට අනුකූලව ක්‍රියා කිරීමටත් මෙම විභාග කොන්දේසි අනුව මා නුසුදුස්සකු බව අනාවරණය වුවහොත් විභාග යට පෙර හෝ විභාගයෙන් පසුව හෝ මාගේ විභාග අපේක්ෂකත්වය අවලංගු කිරීමට ගනු ලබන තීරණයන් පිළිගැනීමට මා එකඟ වෙමි.

*(ඈ)* මෙහි සඳහන් කිසිදු තොරතුරක් පසුව වෙනස් නොකරමි.

............................................,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

10 *අයදුම්කරුගේ අත්සන සහතික කිරීම :*

මෙම අයදුම්පත ඉදිරිපත් කරනු ලබන ..........................................................................මයා/මිය/මෙනවිය මා පෞද්ගලිකව දන්නා හඳුනන බවත්, ඔහු ඇය නියමිත විභාග ගාස්තුව ගෙවා ඇති බවත්,එම ලදුපත අයදුම්පතෙහි අලවා ඇති බවත්, ඔහු/ඇය .................. ................ වැනි දින මා ඉදිරිපිට දී ඔහු/ඇය ගේ අත්සන තැබූ බවත්, සහතික කරමි.

........................................
අත්සන සහතික කරන නිලධාරියාගේ
අත්සන හා නිල මුද්‍රාව.

දිනය :.................................
සහතික කරන නිලධාරියාගේ සම්පූර්ණ නම :................................................
තනතුර :............................................
ලිපිනය :............................................

**රජයේ සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ සහතිකය**

මෙම අයදුම්පත්‍රය ඉදිරිපත් කරන...................................................................................................................මයා/මිය/මෙනවිය දැනට.. ................................................................................ කාර්යාලයේ/ආයතනයේ .................................... දින සිට මේ දක්වා ................................. ............................ (තනතුර) වශයෙන් ස්ථිර /තාවකාලික/අනියම් (අනවශ්‍ය වචන කපා හරින්න) තනතුරක සේවය කරන බවද, ඔහුගේ /ඇයගේ සේවය සතුටුදායක බවද, මෙම විභාගයේ ප්‍රතිඵල අනුව පත්වීමක් සඳහා ඇය/ඔහු තෝරාගනු ලැබුවහොත් ඔහු /ඇය දැනට දරන තනතුරින් නිදහස් කරන බවද/නොකරන බවද, ඉහත සඳහන් කර ඇති තොරතුරු සත්‍ය බවද සහතික කරමි.

........................................................
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ
අත්සන හා නිල මුද්‍රාව.

දිනය :.................................
සහතික කරන නිලධාරියාගේ නම :.................................
තනතුර :.................................
ලිපිනය :.................................

03-1482

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.